කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

නීති පීඨය

නීතිවේදී උපාධි පරීක්ෂණය - තෙවන වසර -2017

අන්තර්ජාතික ආයෝජන නීතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න ගණන - 7යි

**එක් කොටසකින් ප්‍රශ්න දෙක (2)** බැගින් තෝරාගෙන ප්‍රශ්න **හතරකට පමණක්** පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කරනු ලැබේ.)

**අ කොටස**

අනෝරා රාජ්‍යයෙහි ලියාපදිංචි සමාගමක් වන Cleanup සමාගම කසල ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාරයෙහි නිරත සමාගමකි. ඉන්සොම්නියා රාජ්‍යයෙහි කසල ප්‍රතිචක්‍රීකරණය සඳහා පුළුල් අවස්ථාවන් ඇති බව සොයාගන්නා Cleanup සමාගම ඉන්සොම්නියාවෙහි අගනුවර වන ජර්මියාවේ නගර සභාව හා සන්ධිය ගිවිසුමට ඇතුළත් වේ. ජර්මියාව රජයේ සෘජු පාලනයට යටත් වේ. මෙම සන්ධිය ගිවිසුම යටතේ ජර්මියාවේ නගර සභාව කසල එකතු කොට ඒවා වෙන් කර, ජර්මියාවට එතරම් නුදුරින් වූ නගරයක් වන වර්මියාවෙහි පිහිටි Cleanup විසින් පවත්වාගෙන යන කසල ප්‍රතිචක්‍රීකරණ බලාගාරය වෙත භාරදීමේ කටයුත්ත භාරගෙන ඇත. භූගෝලීය නැලපීම හේතු කොටගෙන Cleanup කසල ප්‍රතිචක්‍රීකරණ බලාගාරයේ මෙහෙයුම් කටයුතු මෙම ස්ථානයෙහි සිදු කිරීමට තෝරා ගෙන ඇත.

අනෝරා සහ ඉන්සොම්නියාව අතර පවතින ද්වි පාර්ශවීය ආයෝජන සම්මුතිය (BIT) යටතේ ආයෝජන සම්බන්ධයෙන් සම්පූර්ණ ආරක්ෂාව සහතික වන බව දැක්වුවද, සිවිල් කෝලාහල හෝ කැරලි හේතු

කොටගෙන ආයෝජනයන්ට සිදුවන කිසිදු හානියක් සම්බන්ධයෙන් ඉන්සොම්නියාව වග නොකියන බවට වන වගන්තියක් ඉන්සොම්නියාව පාර්ශව දෙක අතර වන ගිවිසුමට ඇතුළත් කරයි.

ආයෝජනය ක්‍රියාත්මක වීම ආරම්භ වී මසක පමණ කාලයකින් අනතුරුව බලාගාරය පාරිසරික වශයෙන් අවධානම් සහගත බවට චෝදනා කරමින් සහ ජර්මියාවේ කසල වර්මියාවට රැගෙන ඒම ඔවුන්ට අවශ්‍ය නොවන බව දක්වමින් වර්මියාවේ පදිංචිකරුවන් Cleanup ට එරෙහිව විශාල විරෝධතාවක් දියත් කරයි. ජර්මියාවේ නගර සභාව ආයෝජනය පවරා ගන්නා අතර සේවකයන්ට ඔවුන්ගේ වැටුප් ගෙවා ඉන් අනතුරුව බලාගාරය වසා දමයි. නගර සභාව ඉන්සොම්නියාවේ මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට පොරොන්දු වුවත් එය සිදු කිරීමට නගර සභාව අසමත් වූ බව පසුව අනාවරණය වෙයි. පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් නොමැති බැවින් Cleanup, වාතාශ්‍රය සහ ජල දූෂණය ඇති කරවන යල් පැනගිය තාක්ෂණය භාවිත කර ඇත.

Cleanup ඉන්සොම්නියාවට එරෙහිව ආයෝජන ආරවුල් නිරාකරණය සඳහා වන අන්තර්ජාතික මධ්‍යස්ථානයෙහි (ICSID) බේරුම්කරණ ක්‍රියාමාර්ග ආරම්භ කරන අතර බේරුම්කරණය BIT මත පදනම් වෙමින් Cleanup වෙත ඇමරිකානු ඩොලර් මිලියන 20 ක වන්දි මුදලක් ප්‍රදානය කරයි.

01. ඔබ ICSID බේරුම්කරණ පර්ෂදයෙහි සමාජිකයෙකු යයි උපකල්පනය කරන්න. ආයෝජන අපසර්ජනයක් මෙහි සිදු වූයේ යයි ඔබ තර්ක කරන්නේ කෙසේද?

02. පර්ෂදය BIT හි අන්තර්ගත සම්පූර්ණ ආරක්ෂාව පිළිබඳ වගන්තිය මත පදනම් වෙමින් Cleanup වෙත වන්දි ප්‍රදානය කර ඇත. ඉන්සොම්නියාව වෙනුවෙන් කටයුතු කරන නීතිඥවරයෙකු ලෙස ඔබ මෙම තීරණය අභියෝග කරන්නේ කෙසේද?

**03.** Cleanup බේරුම්කරණ ප්‍රදානය ඉන්සොම්නියාවට එරෙහිව බලාත්මක කිරීමට අදහස් කරයි. ඉන්සොම්නියාවේ නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීතියට සමාන යයි උපකල්පනය කරමින් අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය සහ ප්‍රදානය බලාත්මක කිරීම වළක්වාලීමට ඉන්සොම්නියාව ගත යුතු පියවර සැකෙවින් දක්වන්න.

## ආ කොටස

**04.** Petroca බලශක්තියෙන් සපිරි තෙවන ලෝකයට අයත් කුඩා රාජ්‍යයක් වන අතර සිය කාර්මික සංවර්ධනය වේගවත් කර ගැනීමට උත්සුක වෙයි. ප්‍රාග්ධන අපනයන රාජ්‍යයක් වන Aaland, Petroca හි ඉතා විශාල බලශක්ති ව්‍යාපෘති ආශ්‍රිත ගිවිසුම් වලට ඇතුළත් වීමට අදහස් කරයි. කෙසේ වෙතත් Petroca හි දේශපාලන වාතාවරණය සහ ස්ථාවරත්වය කෙටිකාලීන යයි Aaland බිය වෙයි.

Petroca සමඟ ද්වි පාර්ශ්වීය ආයෝජන සම්මුතියකට එළඹීමට Aaland අදහස් කරයි. ඔබ Aaland හි නියෝජිතයා වෙයි. Aaland සහ Petroca අතර ද්වි පාර්ශ්වීය ආයෝජන සම්මුතිය (BIT) සංග්‍රහිත කරන්න. BIT ට ඇතුළත් කිරීමට ඔබ අදහස් කරන ඕනෑම ප්‍රධාන වගන්ති (Articles) තුනක් හේතු දක්වමින් හඳුනා ගන්න.

**05.** "බහුජාතික සමාගම් වල වගකීම් සම්පන්න භාවය අපේක්ෂා කෙරෙන, පැන නැගෙමින් පවතින සම්මතයන්ට (emerging standards) අනුකූලව සිය බහුජාතික සමාගම් කටයුතු කරන බව සාක්ෂාත් කරලීම සඳහා මව් රාජ්‍යයේ මැදිහත් වීම අවශ්‍ය කෙරෙන, විදේශ ආයෝජන ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් මව් රාජ්‍යය වෙත අයිතිවාසිකම් මෙන්ම යුතුකම්ද ඇත යන සංකල්පයේ විකාශයක් දැන් පවතී."

*M. Sornarajah, The International Law of Foreign Investment, 3rd ed., (2010), p. 144*

මෙම පැන නැගෙමින් පවතින සම්මතයන් මොනවාද යන්න සහ මව් රාජ්‍යයන් ඒවා සම්බන්ධයෙන් කෙලෙස ප්‍රතිචාර දක්වා ඇද්ද යන්න සුදුසු නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

06. "සත්කාරක රාජ්‍යය වෙත වැදගත් අවස්ථාවන් ලබා දෙමින් විදේශ ආයෝජන, සත්කාරක රාජ්‍යයන්හි සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමට උපරිම ලෙස දායක විය හැකි අතරම, එමගින් සත්කාරක රාජ්‍යය තුළ බරපතල අවධානම් සහ අභියෝගද ඇති කළ හැකිය."

විදේශ ආයෝජන නීතිය ආශ්‍රිත ප්‍රධාන පරස්පරවිරෝධි න්‍යායයන් ඇසුරින් විදේශ ආයෝජනයකට සත්කාරක රාජ්‍යය වෙත ලබා දිය හැකි අවස්ථාවන් සහ සිදු කළ හැකි අවධානම් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

07. විදේශ ආයෝජකයාගේ අයිතිවාසිකම් තීරණය කිරීම සම්බන්ධයෙන් සත්කාරක රාජ්‍යයන් සතුව කාර්‍ය්‍ය භාරයක් පවතී. සත්කාරක රාජ්‍යයක් කරා විදේශ ආයෝජකයාගේ පැමිණීම සම්බන්ධයෙන් සහ විදේශ ආයෝජකයා ව්‍යාපාර මෙහෙයවන ආකාරය සම්බන්ධයෙන් එමගින් කොන්දේසි නියම කරයි. එබැවින් සත්කාරක රාජ්‍යයන් තුළදී විදේශ ආයෝජකයකු විවිධ බාධක සහ සීමාවන් ගණනාවකට මුහුණ දෙයි.

සිය ආර්ථික සහ සාමාජීය සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම පිණිස විදේශ ආයෝජන නියාමනය කිරීමට සත්කාරක රාජ්‍යය සතු අයිතිය ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර අදාළ නඩු තීන්දු නීතිය ඇසුරින් තහවුරු කළ යුතුය.

...............................